# HARTI

# ආහාර තොරතුරු විවරණිකාව


14 වෙළුම | 2021 අප්‍රේල් | නො.:04


## සහල්

සියලුම සහල් වර්ගවල සිල්ලර මිල ගණන් 2%-6% අතර අගයකින් ඉහළ ගිය අතර උත්සව සමය හේතුවෙන් ඉල්ලුම ඉහළයාම මෙන්ම සැපයුමේ පහළයාම ද මේ සඳහා හේතු විය. සියලු සහල් වර්ගවල සිල්ලර මිල රජය විසින් පනවන ලද උපරිම සිල්ලර මිල සීමාව ඉක්මවා ගොස් තිබුණි.

## එළවළු

එළවළු සඳහා සිල්ලර මිල ගණන් තවදුරටත් 2%-29% පරාසය තුළ පහළ යන ලදී. එළවළු කිලෝවක් සඳහා උපරිම මිල රු.600.00ක් ලෙස මුරුංගා සඳහා ද අවම මිල රු.50.00ක් ලෙස පිපිඤ්ඤා සඳහා ද වාර්තා විය. තවද අප්‍රේල් මාසයේදී සිල්ලර වෙළඳපොළ තුළ බොහොමයක් එළවළු වර්ග අලෙවි වූයේ කිලෝවකට රු.200.00 හෝ ඊට වඩා අඩු මිල ගණන්වලට ය. ඉදිරි මාසයේදී එළවළු සඳහා අවාරය ආරම්භ විය හැකි බැවින් මිල ගණන්වල ඉහළයාමක් අපේක්ෂා කෙරේ.




අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය ,
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත , කොළඹ 07.
කෘෂිකර්ම අමාත්‍යාංශය

දු.අ. 011-2696981
විද්‍යුත් තැපැල mfpaharti@yahoo.com.
ෆැක්ස් 011-2682283
අන්තර් ජාලය www.harti.gov.lk

**සටහන**

මෙම විවරණිකාව මාසිකව ප්‍රකාශයට පත් කරනු ලබන අතර ඒ මඟින් තෝරා ගන්නා ලද ප්‍රධාන ආහාර ද්‍රව්‍යයන්ගේ ගොවිපල මිල, තොග මිල සහ සිල්ලර මිල පිළිබඳව සලකා බැලේ. මෙහිදී ඉදිරිපත් කරන තොරතුරු කොළඹ සහ තදාසන්න නාගරික කේන්ද්‍ර කීපයක සහ තෝරා ගන්නා ලද ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවල වෙළෙඳපොළ ආශ්‍රයෙන් සිදු කෙරේ. වගා බිම් ප්‍රමාණය, නිෂ්පාදන ප්‍රමාණය සහ ආනයන ප්‍රමාණය යන තොරතුරු මෙම විවරණිකාවේ අන්තර්ගත වේ.

පවතින මිල ගණන්, මිල පරාසයන් සාමාන්‍ය, පසුගිය මාසයේ සහ පසුගිය වර්ෂයේ එම මිල ගණන් සමඟ සංසන්දනාත්මකව විග්‍රහ කෙරේ. මෙහි තිබෙන මිල ගණන් විශේෂයෙන් සඳහන් නොකර තිබේ නම් එය පසුගිය මාසයේ මිල ගණන් හා සංසන්දනය කර ඇති බව සැලකේ.


**සම්බන්ධීකරණය**
ආචාර්ය ඊ.ඒ.සී.ප්‍රියංකර

**පර්යේෂණ කණ්ඩායම**

| | |
|---|---|
| ඩබ්.ඒ.එන්.විජේසූරිය | - වී |
| ආචාර්ය එන්.පී.ජී.සමන්ත | - සහල් |
| රෝෂිණී රඹුක්වැල්ල | - වියළි මිරිස්, ලූනු |
| ආචාර්ය ඊ.ඒ.සී.ප්‍රියංකර | - එළවළු,තිරිඟු පිටි , සීනි |
| රුවිනි විදානපතිරණ | - අර්තාපල් |
| ඉන්දිකා එදිරිසිංහ | - පලතුරු |
| පී.ඒ.ජේ.චම්පිකා | - කරවල, මස්, මාළු, බිත්තර - |
| අයි.පී.පී.එම්.විජේසිංහ | - මාෂ භෝග |

**දත්ත සහ තොරතුරු සම්පාදනය**
කේ.කේ.එම්.අප්සරා
ඩී.එම්.ඩී.එස්.ප්‍රේමදාස
ඩබ්.ජී.එන්.මල්කාන්ති

දත්ත සැකසුම
කේ.ඒ.ආර්.පත්මසිරි

පරිගණක ගත **කිරීම**
චන්ද්‍රිකා හෙට්ටිගේ


**දත්ත රැස් කරන ප්‍රදේශ**

**කොළඹ සහ අවට වෙළෙඳපොළවල්**

1. කඩවත
2. කිරිබත්ගොඩ
3. මහරගම
4. කිරුළපන
5. නුගේගොඩ
6. **පිටකොටුව**
7. **නාරාහේන්පිට**
8. **දෙමටගොඩ**
9. **තොටලඟ**
10. **පැලියගොඩ**

**පිට පළාත් වෙළෙඳපොළවල්**

1. නුවරඑළිය
2. දඹුල්ල
3. මාතර
4. කුරුණෑගල
5. ඇඹිලිපිටිය
6. නුවර
7. මීගොඩ
8. කළුතර
9. දිවුලපිටිය
10. හම්බන්තොට
11. කැප්පෙටිපොළ
12. පුත්තලම
13. තඹුත්තේගම
14. අනුරාධපුරය
15. රත්නපුර
16. දෙහිඅත්තකණ්ඩිය
17. බදුල්ල
18. තිස්සමහාරාමය
19. නිකවැරටිය
20. පොළොන්නරුව
21. ගාල්ල
22. මන්නාරම
23. මඩකලපුව
24. ත්‍රිකුණාමලය
25. යාපනය
26. මුලතිව්
27. වව්නියාව
28. කිලිනොච්චිය
29. කෑගල්ල
30. අම්පාර
31. මොණරාගල

## 01. වී නිෂ්පාදනය

### භෝග තත්ත්වය

වෙළඳපොළට ඉහළ වී අස්වැන්නක් නිදහස් කරමින් මෙවර 2020/21 මහ කන්නයේ වී අස්වනු නෙලීමේ කටයුතු මුළුමනින්ම පාහේ අවසන් විය. වී වගාවේ වර්ධනයට පැවති හිතකර තත්ත්වයත්, අඛණ්ඩව ලබාදුන් පොහොර සහනාධාරය සහ ප්‍රධාන වාරි ජලාශවල පැවති සතුටුදායක ජල ධාරිතාවයත් හේතුවෙන් වී නිෂ්පාදනය බෙහෙවින් සතුටුදායක විය. රටේ සියලුම ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවල පාහේ වී නිෂ්පාදනය සතුටුදායක වූ අතර මෙයට හෙක්.802,494 වූ ඉහළ වගා බිම් ප්‍රමාණයක් වගා වීම හේතු විය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බෝග පුරෝකථන වාර්තාවට අනුව මහ කන්නයේ අපේක්ෂිත වී නිෂ්පාදනය ටොන් මිලියන 3.12ක් විය. එම වී නිෂ්පාදනය මාස 10ක කාලයක් සඳහා රටට ප්‍රමාණවත් වනු ඇත. ඉදිරි 2021 යල් කන්නයේ වී වගා ඉලක්කය හෙක්. 498,160ක් වේ. රටතුළ පවතින වසංගත තත්ත්වයත් සමඟ ආහාර සුරක්ෂිතතාවය වැදගත් වන බැවින් ගොවීන් ඉහළ වී වගා බිම් ප්‍රමාණයක් සඳහා යොමු වනු ඇතැයි අපේක්ෂා කළ හැකිය.

**වගුව1.1 : වී සඳහා ගොවියාට ලැබුණු මිල -2021 අප්‍රේල්**

| වර්ග/ ප්‍රදේශය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2021 අප්‍රේ. | 2021 අප්‍රේ. | 2021 මාර්තු | 2020 අප්‍රේ. | 2021 මාර්තු | | 2020 අප්‍රේ. | |
| | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු | කි.ග්‍රෑ.රු | % | කි.ග්‍රෑ.රු | % |
| **කෙටි වී (සම්බා)** | | | | | | | | |
| අනුරාධපුරය | 58.00-60.00 | 59.20 | - | - | - | - | - | - |
| පොළොන්නරුව | 69.00-79.00 | 72.25 | 61.91 | - | 10.34 | 16.71 | - | - |
| කලාවැව | 56.50-70.00 | 64.53 | 55.31 | - | 9.22 | 16.68 | - | - |
| කුරුණෑගල | 57.00-60.00 | 58.67 | 54.67 | - | 4.00 | 7.32 | - | - |
| දෙහිඅත්තකණ්ඩිය | 64.00-65.00 | 64.50 | - | - | - | - | - | - |
| නිකවැරටිය | 60.00-69.00 | 64.00 | 56.80 | - | 7.20 | 12.68 | - | - |
| අම්පාර | 55.00-75.00 | 61.34 | 58.68 | - | 2.66 | 4.53 | - | - |
| **සුදු දිග වී (නාඩු)** | | | | | | | | |
| අනුරාධපුරය | 53.00-55.00 | 54.00 | - | - | - | - | - | - |
| පොළොන්නරුව | 59.00-63.00 | 60.25 | 52.67 | - | 7.58 | 14.38 | - | - |
| කලාවැව | 52.00-62.00 | 55.80 | 49.47 | - | 6.33 | 12.80 | - | - |
| කුරුණෑගල | 50.00-54.00 | 51.92 | 49.77 | - | 2.15 | 4.32 | - | - |
| දෙහිඅත්තකණ්ඩිය | 56.00-58.00 | 57.00 | - | - | - | - | - | - |
| ඇඹිලිපිටිය | - | - | - | - | - | - | - | - |
| නිකවැරටිය | 55.00-57.00 | 56.25 | 53.00 | - | 3.25 | 6.13 | - | - |
| මාතර | - | - | - | - | - | - | - | - |
| හම්බන්තොට | - | - | - | | - | - | - | - |
| අම්පාර | 48.00-56.50 | 53.63 | 50.97 | - | 2.66 | 5.22 | - | - |
| **දිග වී (රතු)** | | | | | | | | |
| අනුරාධපුරය | 53.00-55.00 | 54.00 | 54.38 | - | -0.38 | -0.69 | - | - |
| මාතර | 53.00-56.00 | 55.00 | - | - | - | - | - | - |
| හම්බන්තොට | - | - | - | - | - | - | - | - |
| ඇඹිලිපිටිය | 53.00-55.00 | 54.15 | 54.92 | - | -0.77 | -1.40 | - | - |

*මූලාශ්‍රය : අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

### වී ගොවියාට ලැබුණු මිල

මෙවර ලැබුණු ඉහළ වී අස්වැන්නත් සමඟ ඉහළ වෙළෙඳපොළ සැපයුමක් තිබියදීත්, වී මිල ඉහළ මට්ටමක පවතිනුයේ ප්‍රධාන වශයෙන් පෞද්ගලික සහල් මෝල් හිමියන් සහ වී අලෙවි මණ්ඩලය වඩාත් තරඟකාරී ලෙස වී මිල දී ගැනීමට අවතීර්ණ වීම හේතුවෙනි.

බොහොමයක් ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවල වී මිල ගණන් ඉහළ මට්ටමක පැවති අතර පසුගිය වසරේ සමාන කාලයට සාපේක්ෂව ඉහළ ගොස් තිබුණි. කෙටි වී සහ සුදු දිග වී මිල පිළිවෙළින් 5%-17% සහ 4%-14%අතර අගයන්ගෙන් ඉහළ ගොස් තිබුණු අතර උපරිම මිල ඉහළයාම පොලොන්නරුවෙන් වාර්තා විය. මේ අතර රතු දිග වී මිල මාතර සහ ඇඹිලිපිටිය ප්‍රදේශවල සුළු වශයෙන් පහළ ගොස් තිබුණි. සුදු දිග නාඩු වී මිල කිලෝවක් සඳහා රු.48.00-63.00 අතර පැවතුණි. මේ අතර දකුණු පළාතේ නිෂ්පාදන ප්‍රදේශවල රතු දිග වී කිලෝවක් රු.53.00-56.00 අතර පැවතුණි.

### ඉල්ලුම / සැපයුම සහ මිල හැසිරීම

### සහල් තොග මිල

වී අස්වනු නෙළීම උපරිම මට්ටමෙහි පැවතිය ද සහල් සැපයුමෙහි අපේක්ෂිත මට්ටමේ ඉහළයාමක් සිදු නොවුණි. මේ හේතුවෙන් රතු කැකුළු සහල් වල පැවති සුළු මිල පහළයාම හැර අනෙකුත් සියලුම සහල් වර්ගවල තොග මිල ගණන් ඉහළගිය අතර උපරිම මිල ඉහළයාම වූ 4%ක් දෙවන ශ්‍රේණියේ සම්බා සඳහා සටහන් විය. සම්බා සහල් සැපයුමෙහි සැලකිය යුතු පහළයාමක් මාසය පුරාම නිරීක්ෂණය වූ අතර දෙවන ශ්‍රේණියේ සම්බා සහල් කිලෝවක තොග මිල රු.125.00-132.00 අතර පැවතුණි. තවද, පළමු ශ්‍රේණියේ සම්බා තොග වෙළෙඳපොළ තුළ නොතිබීම විශේෂ ලක්ෂණයක් විය. දෙවන ශ්‍රේණියේ නාඩු සහල් කිලෝවක මිල රු.98.00-105.00 අතර මාසය තුළ පැවති අතර පසුගිය මාසයට සාපේක්ෂව 3%ක මිල ඉහළයාමක් සටහන් විය.

### සහල් සිල්ලර

සියලුම සහල් වර්ගවල සිල්ලර මිල ගණන් පසුගිය මාසයට සාපේක්ෂව ඉහළගිය අතර උත්සව සමය හේතුවෙන් ඉල්ලුම ඉහළයාම මෙන්ම සැපයුමෙහි පහළයාම ද මේ සඳහා හේතු විය. විශේෂයෙන්ම සියලුම සහල් වර්ගවල සිල්ලර මිල රජය විසින් පනවන ලද උපරිම සිල්ලර මිල සීමාවට වඩා ඉහළින් පිහිටීම විශේෂ ලක්ෂණයක් විය. පළමු සහ දෙවන ශ්‍රේණියේ සම්බා සහල් කිලෝවක සිල්ලර මිල පිළිවෙළින් රු.140.00-150.00 සහ රු.128.00-140.00 අතර විය. තවද, පළමු සහ දෙවන ශ්‍රේණියේ නාඩු සහල් කිලෝවක මිල රු.115.00-125.00සහ රු.100.00-115.00 අතර පරාසයකින් පැවතුණි. පසුගිය මාසයට සාපේක්ෂව උපරිම මිල ඉහළයාම වූ 6%ක් දෙවන ශ්‍රේණියේ නාඩු සහල් සඳහා සටහන් විය.

**වගුව 1.2 : සහල් මිල (තොග සහ සිල්ලර ) –2021 අප්‍රේල්**

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2021 අප්‍රේ. | 2021 අප්‍රේ. | 2021 මාර්තු | 2020 අප්‍රේ. | 2021 මාර්තු | | 2020 අප්‍රේ. | |
| | කි.ගෑ.රු. | කි.ගෑ.රු. | කි.ගෑ.රු. | කි.ගෑ.රු. | කි.ගෑ.රු. | % | කි.ගෑ.රු | % |
| **තොග මිල** | | | | | | | | |
| සම්බා 1 | - | - | - | - | - | - | - | - |
| සම්බා 2 | 125.00-132.00 | 126.80 | 121.46 | - | 5.34 | 4.40 | - | - |
| සම්බා 3 | - | - | - | - | - | - | - | - |
| නාඩු 1 | - | - | 105.87 | - | - | - | - | - |
| නාඩු 2 | 98.00-105.00 | 101.25 | 97.92 | - | 3.33 | 3.40 | - | - |
| රතු කැකුළු | 92.00-96.00 | 93.83 | 93.96 | - | -0.13 | -0.14 | - | - |
| සුදු කැකුළු | 95.00-105.00 | 98.03 | 95.66 | - | 2.37 | 2.47 | - | - |
| ආනයනික පොන්නි සම්බා | - | - | - | - | | | - | - |
| ආනයනික සුදු කැකුළු | - | - | - | - | | | - | - |
| ආනයනික නාඩු | - | - | - | - | | | - | - |
| **සිල්ලර මිල** | | | | | | | | |
| සම්බා 1 | 140.00-150.00 | 143.98 | 139.71 | - | 4.28 | 3.06 | - | - |
| සම්බා 2 | 128.00-140.00 | 133.36 | 128.86 | - | 4.50 | 3.49 | - | - |
| සම්බා 3 | - | - | - | - | - | - | - | - |
| නාඩු 1 | 115.00-125.00 | 118.02 | 113.55 | - | 4.47 | 3.94 | - | - |
| නාඩු 2 | 100.00-115.00 | 109.66 | 103.75 | - | 5.91 | 5.70 | - | - |
| රතු කැකුළු | 98.00-110.00 | 104.80 | 102.71 | - | 2.09 | 2.04 | - | - |
| සුදු කැකුළු | 98.00-115.00 | 106.46 | 103.35 | - | 3.11 | 3.00 | - | - |
| ආනයනික පොන්නි සම්බා | - | - | - | - | - | - | - | - |
| ආනයනික සුදු කැකුළු | - | - | - | - | - | - | - | - |
| ආනයනික නාඩු | - | - | - | - | - | - | - | - |

*මූලාශ්‍රය: අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

## 2. අතිරේක ආහාර භෝග

## 2.1 මිරිස්

### ඉල්ලුම / සැපයුම සහ මිලෙහි හැසිරීම

මහ කන්නයේ අස්වනු අවසන් වෙමින් පැවතීමත් සමඟ ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවලින් අමු මිරිස් තොග සැපයුම මෙම මාසය තුළ පහළ ගොස් තිබුණි. ඒ අනුව අමු මිරිස් තොග මිල ගණන් කිලෝවක් රු.13.00කින් පමණ ඉහළ ගොස් තිබුණි. නමුත් සිල්ලර වෙළෙඳපොළවල අමු මිරිස් තොග ප්‍රමාණවත් පරිදි පැවතීම හේතුවෙන් සිල්ලර මිල කිලෝවක් රු.36.00කින් පහළ ගොස් ඇත. අමු මිරිස් තොග මිල රු.100.00-320.00ක් වශයෙන් ද සිල්ලර මිල කිලෝවක් රු.180.00-500.00 ලෙස ද වාර්තා විය. ආනයනික තොග ප්‍රමාණවත් පරිදි පැවතීම හේතුවෙන් ආනයනික වියළි මිරිස් තොග මිල කිලෝවක් රු.3.00කින් පමණ ද සිල්ලර මිල කිලෝවක් රු.1.00කින් පමණ ද පහළ ගොස් ඇත. ආනයනික වියළි මිරිස් සඳහා සාමාන්‍ය තොග මිල රු.499.25ක් සහ සිල්ලර මිල රු.601.31ක් වශයෙන් ද වාර්තා විය.

**වගුව 2.1.1 : අමු මිරිස් සඳහා ගොවියාට ලැබුණු මිල (කි.ගෑ.රු.)-2021 අප්‍රේල්**

| ප්‍රදේශය | 1 සතිය | 2 සතිය | 3 සතිය | 4 සතිය |
|---|---|---|---|---|
| දඹුල්ල | 163.50 | 163.50 | 123.00 | 118.75 |
| හම්බන්තොට | - | - | - | - |
| ඇඹිලිපිටිය | 252.00 | 252.00 | 213.00 | 241.00 |
| පුත්තලම | - | - | 170.00 | 175.00 |
| අනුරාධපුර | - | - | - | 180.00 |

*මූලාශ්‍රය: අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

**වගුව 2.1.2 : වියළි මිරිස් හා අමු මිරිස් තොග සහ සිල්ලර මිල - 2021 අප්‍රේල්**

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2021 අප්‍රේ. | 2021 අප්‍රේ. | 2021 මාර්තු | 2020 අප්‍රේ. | 2021 මාර්තු | | 2020 අප්‍රේ. | |
| | කි. ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු | කි.ග්‍රෑ.රු. | % | කි.ග්‍රෑ.රු | % |
| **තොග මිල** | | | | | | | | |
| අමු මිරිස් | 100.00-320.00 | 192.18 | 179.20 | - | 12.98 | 7.24 | - | - |
| වියළි මිරිස් (ආනයනික) | 490.00-510.00 | 499.25 | 501.87 | - | -2.62 | -0.52 | - | - |
| **සිල්ලර මිල** | | | | | | | | |
| අමු මිරිස් | 180.00-500.00 | 328.61 | 364.61 | - | -36.00 | -9.87 | - | - |
| වියළි මිරිස් (ආනයනික) | 500.00-700.00 | 601.31 | 602.72 | - | -1.41 | -0.23 | - | - |

*මූලාශ්‍රය: අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

## 2.2 ලොකු ළූණු සහ රතු ළූණු
## ඉල්ලුම / සැපයුම සහ මිලෙහි හැසිරීම

යල කන්නයේ අස්වනු ලබන අගෝස්තු මාසයේ පමණ වෙළෙඳපොළට පැමිණෙන තෙක්ම ආනයනික ලොකුළූණු තොග පමණක් වෙළෙඳපොළේ දැකිය හැකිය. මාතලේ දිස්ත්‍රික්කය තුළ ලොකුළූණු තවාන් කටයුතු මේ දිනවල සිදුවන අතර ලොකුළූණු වගා කටයුතු ලබන මාසයේ සිදු කිරීමට නියමිතව ඇත. ප්‍රමාණවත් ආනයනික තොග වෙළෙඳපොළේ පැවතීම හේතුවෙන් ආනයනික ලොකුළූණු තොග සහ සිල්ලර මිල ගණන් කිලෝවක් රු.17.00 කින් සහ රු.25.00 කින් පහළ ගොස් ඇත. ආනයනික ලොකුළූණු තොග මිල කිලෝවක් රු.52.00-85.00ක් වශයෙන් ද සිල්ලර මිල රු.60.00-120.00ක් ලෙස ද වාර්තා විය.

ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවලින් රතුළූණු තොග සැපයුම පහළයාම හේතුවෙන් සිනන් සහ වේදාලන් රතුළූණු තොග මිල පිළිවෙළින් කිලෝවක් රු.50.00 කින් සහ රු.72.00 කින් ඉහළ ගොස් තිබුණි. තොග මිල ඉහළයාමට සාපේක්ෂව සිනන් සහ වේදාලන් සිල්ලර මිල ගණන් ද පිළිවෙළින් රු.68.00ක් සහ රු.81.00ක් වශයෙන් ඉහළ ගොස් තිබුණි. තොග ප්‍රමාණය පහළයාම හේතුවෙන් ආනයනික රතුළූණු තොග සහ සිල්ලර මිල ගණන් රු.88.00ක් සහ රු.19.00ක් වශයෙන් ඉහළ ගොස් ඇත.

**වගුව 2.2.1: රතු ලූනු සහ ලොකු ලූනු තොග සහ සිල්ලර මිල (කි.ග්‍රෑ.රු) -2021 අප්‍රේල්**

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2021 අප්‍රේ. | 2021 අප්‍රේ. | 2021 මාර්තු | 2020 අප්‍රේ. | 2021 මාර්තු | | 2020 අප්‍රේ. | |
| | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු | කි.ග්‍රෑ.රු | කි.ග්‍රෑ.රු | කි.ග්‍රෑ.රු | % | කි.ග්‍රෑ.රු | % |
| **තොග මිල** | | | | | | | | |
| රතු ලූනු (සිනන්) | 120.00-260.00 | 203.33 | 153.64 | - | 49.69 | 32.34 | - | - |
| රතු ලූනු (වේදාලන්) | 220.00-320.00 | 266.36 | 194.59 | - | 71.77 | 36.88 | - | - |
| රතු ලූනු (ආනයනික) | 200.00-360.00 | 267.58 | 179.58 | - | 88.00 | 49.00 | - | - |
| ලොකු ලූනු (ආනයනික) | 52.00-85.00 | 64.55 | 81.27 | - | -16.72 | -20.57 | - | - |
| ලොකු ලූනු (දේශීය) | - | - | - | - | - | - | - | - |
| **සිල්ලර මිල** | | | | | | | | |
| රතු ලූනු (සිනන්) | 200.00-360.00 | 293.12 | 225.26 | - | 67.86 | 30.13 | - | - |
| රතු ලූනු (වේදාලන්) | 320.00-440.00 | 372.90 | 291.67 | - | 81.23 | 27.85 | - | - |
| රතු ලූනු (ආනයනික) | 200.00-400.00 | 297.36 | 278.85 | - | 18.50 | 6.64 | - | - |
| ලොකු ලූනු(ආනයනික) | 60.00-120.00 | 97.66 | 123.19 | - | -25.54 | -20.73 | - | - |
| ලොකු ලූනු (දේශීය) | - | - | - | - | - | - | - | - |

*මූලාශ්‍රය: අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

## 2.3 අර්තාපල්

### භෝග තත්ත්වය

නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්ක දෙකෙහි ම 2021 යල කන්නය සඳහා වගා කටයුතු අප්‍රේල් මාසයේදී ආරම්භ කරන ලදී. නුවරඑළිය දිස්ත්‍රික්කයේ පවතින වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් නව වගාවන්ට බලපෑම් එල්ල විය. බදුල්ල දිස්ත්‍රික්කයේ යල කන්නය සඳහා නව වගාවන් බොහොමයක් සිදු කරනු ලබන්නේ වී අස්වැන්න ලබාගැනීමෙන් පසුව කුඹුරුවල ය. ක්ෂේත්‍ර තොරතුරු වලට අනුව වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැප්පෙටිපොළ, බෝගහකුඹුර, බොරලන්ද, අම්බගස්දෝව, ඌවපරණගම යන ප්‍රදේශවල මහ කන්නයේ අස්වැන්නෙන් 75%කට වඩා වැඩි ප්‍රමාණයක් අස්වනු නෙලීම් කටයුතු නිම කර ඇති අතර එම ප්‍රදේශවලින් තොග සැපයුම මැයි මාසයේ සිට අවසන් වේ.

### ඉල්ලුම / සැපයුම සහ මිලෙහි හැසිරීම

දේශීය අර්තාපල් සම්බන්ධයෙන් ගත් කළ, වැලිමඩ සහ නුවරඑළිය අර්තාපල් සඳහා මහ කන්නයෙහි අස්වනු සඳහා ප්‍රමාණවත් තොග කොළඹ තොග වෙළෙඳපොළෙහි දක්නට ලැබුණි. එසේම, අප්‍රේල් මාසය තුළ අළුත් අවුරුදු උත්සව සමයේදී ඉල්ලුම ඉහළ මට්ටමක පැවතුණි. වැලිමඩ අර්තාපල් සඳහා තොග මිල 3%කින් පහළ ගොස් තිබූ අතර සිල්ලර මිල 13%කින් ඉහළ ගොස් තිබේ. නුවරඑළිය අර්තාපල් සම්බන්ධයෙන් ගත් කළ, තොග සහ සිල්ලර මිල පිළිවෙළින් 1% සහ 4%කින් ඉහළ ගොස් තිබේ. මේ අතර ආනයනික අර්තාපල් සඳහා විශේෂිත ආනයනික බද්ද 2021/04/27 දින සිට ක්‍රියාත්මක වන පරිදි කිලෝවකට රු.50.00 දක්වා ඉහළ නංවා තිබේ. එබැවින් ආනයනික අර්තාපල් තොග මිල 8%කින් ඉහළ ගොස් ඇති අතර සිල්ලර මිල සැලකිය යුතු ලෙස වෙනස් වී නොමැත. අප්‍රේල් මාසයේදී නුවරඑළිය සහ වැලිමඩ අර්තාපල් සඳහා සාමාන්‍ය නිෂ්පාදන මිල කිලෝවකට පිළිවෙළින් රු.96.00ක් සහ රු.94.00ක් විය. මෙම මාසය තුළ දී වැලිමඩ, නුවරඑළිය සහ ආනයනික අර්තාපල් සඳහා තොග මිල පරාසය කිලෝවකට රු.100.00-120.00, රු.110.00-150.00 සහ රු.75.00-125.00 අතර අගයක පැවතුණි.

**වගුව 2.3.1: අර්තාපල් සඳහා ගොවියාට ලැබුණු මිල, තොග, සිල්ලර සහ ආනයනික මිල**

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2021 අප්‍රේ. | 2021 අප්‍රේ. | 2021 මාර්තු | 2020 අප්‍රේ. | 2021 මාර්තු | | 2020 අප්‍රේ. | |
| | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු | කි.ග්‍රෑ.රු | කි.ග්‍රෑ.රු | කි.ග්‍රෑ.රු | % | කි.ග්‍රෑ.රු | % |
| **ගොවිපල මිල (1)** | | | | | | | | |
| වැලිමඩ | 83.00-100.00 | 93.83 | 96.34 | - | -2.51 | -2.61 | - | - |
| නුවරඑළිය | 87.00-99.00 | 95.60 | 102.74 | - | -7.14 | -6.95 | - | - |
| ආනයනික | - | - | - | - | - | - | - | - |
| **තොග මිල (2)** | | | | | | | | |
| වැලිමඩ | 100.00-120.00 | 104.27 | 107.50 | - | -3.23 | -3.00 | - | - |
| නුවරඑළිය | 110.00-150.00 | 124.20 | 123.38 | - | 0.83 | 0.67 | - | - |
| ආනයනික | 75.00-125.00 | 90.15 | 83.75 | - | 6.40 | 7.64 | - | - |
| **සිල්ලර මිල (3)** | | | | | | | | |
| වැලිමඩ | 120.00-180.00 | 168.03 | 148.88 | - | 19.14 | 12.86 | - | - |
| නුවරඑළිය | 140.00-220.00 | 195.46 | 188.54 | - | 6.93 | 3.67 | - | - |
| ආනයනික | 100.00-160.00 | 122.92 | 122.65 | - | 0.27 | 0.22 | - | - |
| **දළ ආන්තිකය (3-1)** | | | | | | | | |
| වැලිමඩ | | 74.20 | 52.54 | - | 21.65 | 41.21 | - | - |
| නුවරඑළිය | | 99.86 | 85.80 | - | 14.07 | 16.39 | - | - |
| ආනයනික | | - | - | - | - | - | - | - |
| **දළ ආන්තිකය (3-2)** | | | | | | | | |
| වැලිමඩ | | 63.75 | 41.38 | - | 22.37 | 54.06 | - | - |
| නුවරඑළිය | | 71.26 | 65.16 | - | 6.10 | 9.36 | - | - |
| ආනයනික | | 32.77 | 38.90 | - | -6.13 | -15.76 | - | - |

***මූලාශ්‍රය: අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය***

## 2.4 මුංඇට සහ කව්පි

### භෝග තත්ත්වය සහ ප්‍රගතිය

2021 අප්‍රේල් මාසය අවසානයේ දී මුං ඇට වල තොග මිල කිලෝවකට රු.650.00-850.00 අතර පරාසයක තිබී ඇති අතර සාමාන්‍ය මිල කිලෝවකට රු.808.00ක් විය. තොග මිලෙහි අවමය හා උපරිමය අතර වෙනස රු.200.00ක් විය. මාර්තු මාසයේ මිල හා සැසඳීමේදී අවම මිල රු.100.00කින් ද උපරිම මිල රු.50.00කින් ද වැඩි වී ඇත. මාර්තු මාසය හා සැසඳීමේදී අප්‍රේල් මාසයේ තොග මිලෙහි ඉහළයාම 14%කි. එමෙන්ම මුං ඇට වල සිල්ලර මිල ද කිලෝවකට රු.700.00-1,200.00ක පරාසයක් අප්‍රේල් මාසයේ වෙළෙඳපොළ තුළ දැකිය හැකි අතර සාමාන්‍ය මිල රු.911.00ක් වේ. පසුගිය මාසය හා සැසඳීමේදී සිල්ලර මිල 10%කින් වැඩි වී ඇත (වගුව අංක 2.4.1). මිල ඉහළයාමේ උපනතිය අඛණ්ඩව පැවතීම මඟින් ගම්‍ය වනුයේ දේශීය නිෂ්පාදනය ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් නොවන බවයි.

අප්‍රේල් මාසයේ සුදු සහ රතු කව්පි වල සාමාන්‍ය තොග මිල කිලෝවකට රු.589.00ක් විය. සුදු කව්පිවල මිල පරාසය කිලෝවකට රු.540.00-620.00ක් වූ අතර රතු කව්පි මිල පරාසය කිලෝවකට රු.550.00-620.00ක් විය. මාර්තු මාසය හා සැසඳීමේදී රතු සහ සුදු කව්පි තොග මිලෙහි සුළු පහළයාමක් දැකිය හැක. මහ කන්නයේ අස්වැන්න වෙළෙඳපොළට ලැබීම මෙම මිල පහළයාමට හේතු වී ඇත. අප්‍රේල් මාසයේ සුදු කව්පි සහ රතු කව්පිවල සාමාන්‍ය සිල්ලර මිල පිළිවෙළින් කිලෝවකට රු.768.00ක් සහ රු.759.00ක් විය. සුදු සහ රතු කව්පි මිල පරාසය කිලෝවකට රු.640.00-960.00 අතර විය. මාර්තු මාසයේ මිල හා සැසඳීමේදී සුදු කව්පි මිල 4%කින් ද රතු කව්පි මිල 8%කින ්ද ඉහළ ගොස් ඇත. 2020 අප්‍රේල් මාසයේ පැවති දැඩි සංචරණ සීමා හේතුවෙන් වෙළඳපොළ දත්ත ලබා ගැනීමට නොහැකි වීම එම මාසයේ දත්ත නොමැති වීමට හේතු වී ඇත (වගුව 2.4.1)

**වගුව : 2.4.1: මුංඇට සහ කව්පි තොග සහ සිල්ලර මිල -2021 අප්‍රේල්**

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2021 අප්‍රේ. | 2021 අප්‍රේ. | 2021 මාර්තු | 2020 අප්‍රේ. | 2021 මාර්තු | | 2020 අප්‍රේ. | |
| | කි.ග්‍රෑ.රු | කි.ග්‍රෑ.රු | කි.ග්‍රෑ.රු | කි.ග්‍රෑ.රු | කි.ග්‍රෑ.රු | % | කි.ග්‍රෑ.රු | % |
| **තොග මිල** | | | | | | | | |
| මුංඇට | 650.00-850.00 | 808.48 | 707.26 | - | *101.22* | 14.31 | - | - |
| කව්පි ( සුදු) | 540.00-620.00 | 589.48 | 604.31 | - | *-14.83* | -2.45 | - | - |
| කව්පි (රතු) | 550.00-620.00 | 589.01 | 597.13 | - | *-8.12* | -1.36 | - | - |
| **සිල්ලර මිල** | | | | | | | | |
| මුංඇට | 700.00-1200.00 | 911.03 | 827.93 | - | *83.09* | 10.04 | - | - |
| කව්පි (සුදු) | 640.00-960.00 | 768.29 | 741.74 | - | *26.55* | 3.58 | - | - |
| කව්පි (රතු) | 640.00-960.00 | 758.92 | 699.56 | - | *59.36* | 8.49 | - | - |

*මූලාශ්‍රය: අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

## 2.5 රතු පරිප්පු

### ඉල්ලුම/ සැපයුම හා මිලෙහි හැසිරීම

රතු පරිප්පු තොග මිල පරාසය අප්‍රේල් මාසයේදී කිලෝ එකකට රු.165.00-180.00ක් වූ අතර සාමාන්‍ය මිල රු.172.00ක් විය. සිල්ලර මිල කිලෝවකට රු.180.00-200.00 අතර පරාසයක තිබූ අතර සාමාන්‍ය මිල කිලෝවකට රු.187.00ක් විය. 2021 මාර්තු මාසයට සාපේක්සව පරිප්පු තොග මිල 4%කින් ද සිල්ලර මිල 3%කින් ද ඉහළ ගොස් ඇත. 2020 පැවති දැඩි සංචරණ සීමා හේතුවෙන් 2020 අප්‍රේල් මාසයේ දත්ත ලබා ගැනීමට නොහැකි වීම එම මාසයේ දත්ත වාර්තා නොවීමට ප්‍රධාන හේතුව විය.

**වගුව 2.5.1 : රතු පරිප්පු තොග සහ සිල්ලර මිල - 2021 අප්‍රේල්**

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2021 අප්‍රේ. | 2021 අප්‍රේ. | 2021 මාර්තු | 2020 අප්‍රේ. | 2021 මාර්තු | | 2020 අප්‍රේ. | |
| | කි.ග්‍රෑ.රු | කි.ග්‍රෑ.රු | කි.ග්‍රෑ.රු | කි.ග්‍රෑ.රු | කි.ග්‍රෑ.රු | % | කි.ග්‍රෑ.රු | % |
| තොග මිල | 165.00-180.00 | 172.36 | 165.44 | - | 6.92 | 4.18 | - | - |
| සිල්ලර මිල | 180.00-200.00 | 186.57 | 180.93 | - | 5.64 | 3.12 | - | - |

*මූලාශ්‍රය: අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

## 3.එළවළු

### ඉල්ලුම / සැපයුම සහ මිල හැසිරීම

අප්‍රේල් මාසය අවසන් වන විට 2020/21 මහ කන්නයේ එළවළු වගා කටයුතු අවසන් වූ අතර අස්වනු නෙලීමේ කටයුතු තවදුරටත් සිදුවිය. එම නිසා උඩරට සහ පහතරට එළවළු දෙවර්ගයේම සැපයුම තවදුටත් ඉහළ ගොස් තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස උඩරට එළවළු සඳහා තොග මිල ගණන් 1%-34% පරාසය තුළ පහළ ගොස් තිබුණු අතර එහි උපරිමය නෝකෝල් සඳහා ද අවමය ගෝවා සඳහා ද විය. උඩරට එළවළු වර්ග අතරින් උපරිම තොග මිල කිලෝවකට රු.220.00ක් ලෙස බෝංචි සඳහා ද අවම මිල රු.20.00ක් ලෙස රාබු සඳහා ද වාර්තා විය. අප්‍රේල් මස තුළ පහතරට එළවළු සැපයුම ද ඉහළ ගිය බැවින් තොග මිල ගණන් 7%-40% පරාසය තුළ පහළ යන ලදී. උපරිම මිල පහළයාම වැටකොළු සඳහා ද අවම මිල පහළයාම බණ්ඩක්කා සහ මැකරල් සඳහා විය.

කෙසේ වෙතත් අස්වනු නෙලීමේ කටයුතු අවසන් අදියරට පැමිණීම හේතුවෙන් වම්බටු, පිපිඤ්ඤා සහ පතෝල සැපයුම පහළ මට්ටමක පැවති බැවින් තොග මිල ගනන් පිළිවෙළින් 128%, 10% සහ 11% ලෙස ඉහළ ගොස් තිබුණි. පහතරට එළවළු කිලෝවක් සඳහා උපරිම තොග මිල රු.400.00ක් ලෙස මාළුමිරිස් සඳහා ද අවම මිල රු.20.00ක් ලෙස පිපිඤ්ඤා සඳහා ද විය.

**වගුව 3.1 : එළවළු තොග මිල - 2021 අප්‍රේල්**

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2021 අප්‍රේ. | 2021 අප්‍රේ. | 2021 මාර්තු | 2020 අප්‍රේ. | 2021 මාර්තු | | 2020 අප්‍රේ. | |
| | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | % | කි.ග්‍රෑ.රු. | % |
| බෝංචි | 70.00-220.00 | 121.50 | 163.87 | - | -42.37 | -25.86 | - | - |
| කැරට් | 100.00-180.00 | 135.00 | 139.80 | - | -4.80 | -3.43 | - | - |
| ලීක්ස් | 50.00-80.00 | 64.25 | 76.60 | - | -12.35 | -16.12 | - | - |
| බීට්රූට් | 50.00-130.00 | 77.80 | 92.32 | - | -14.52 | -15.73 | - | - |
| නෝකෝල් | 40.00-70.00 | 55.75 | 84.00 | - | -28.25 | -33.63 | - | - |
| රාබු | 20.00-60.00 | 35.63 | 51.00 | - | -15.38 | -30.15 | - | - |
| ගෝවා | 80.00-150.00 | 100.67 | 101.18 | - | -0.52 | -0.51 | - | - |
| තක්කාලි | 50.00-160.00 | 83.25 | 123.44 | - | -40.19 | -32.56 | - | - |
| බණ්ඩක්කා | 50.00-80.00 | 66.88 | 71.67 | - | -4.79 | -6.69 | - | - |
| වම්බටු | 80.00-300.00 | 158.00 | 69.20 | - | 88.80 | 128.32 | - | - |
| මාළු මිරිස් | 140.00-400.00 | 225.00 | 221.60 | - | 3.40 | 1.53 | - | - |
| වට්ටක්කා | 35.00-70.00 | 57.88 | 75.73 | - | -17.86 | -23.58 | - | - |
| පිපිඤ්ඤා | 20.00-50.00 | 34.00 | 31.00 | - | 3.00 | 9.68 | - | - |
| කරවිල | 70.00-160.00 | 114.00 | 138.07 | - | -24.07 | -17.43 | - | - |
| පතෝල | 60.00-110.00 | 85.25 | 77.02 | - | 8.23 | 10.69 | - | - |
| මුරුංගා | 170.00-250.00 | 196.64 | - | - | - | - | - | - |
| වැටකොළු | 50.00-110.00 | 71.63 | 118.60 | - | -46.98 | -39.61 | - | - |
| මෑ කරල් | 40.00-80.00 | 61.68 | 66.20 | - | -4.52 | -6.83 | - | - |
| අළු කෙසෙල් | 30.00-60.00 | 47.88 | 57.90 | - | -10.03 | -17.31 | - | - |
| අමු මිරිස් | 100.00-320.00 | 192.18 | 179.20 | - | 12.98 | 7.24 | - | - |
| දෙහි | 70.00-120.00 | 85.21 | 75.76 | - | 9.45 | 12.48 | - | - |

***මූලාශ්‍රය: අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය***

සිල්ලර වෙළෙඳපොළ තුළ එළවළු මිල හැසිරීම තොග වෙළෙඳපොළ මිල හැසිරීමට බොහෝ දුරට සමානතාවයක් දක්වන ලදී. උඩරට එළවළු සඳහා සිල්ලර මිල ගණන් 2%-14% පරාසය තුළ පහළ ගිය අතර කිලෝවක් සඳහා උපරිම මිල රු.280.00ක් ලෙස බෝංචි සහ කැරට් සඳහා ද අවම මිල රු.60.00ක් ලෙස රාබු සඳහා ද විය. පහතරට එළවළු සිල්ලර මිල ගණන් ද 5%-29% පරාසය තුළ පහළ ගිය අතර එහි උපරිමය තක්කාලි සඳහා ද අවමය බණ්ඩක්කා සහ අළු කෙසෙල් සඳහා ද විය.

අප්‍රේල් මාසය තුළ පහතරට එළවළු කිලෝවක් සඳහා උපරිම මිල රු.600.00ක් ලෙස මුරුංගා සඳහා ද අවම මිල රු.50.00ක් ලෙස පිපිඤ්ඤා සඳහා ද විය. මැයි මාසයේ සිට එළවළු සඳහා අවාරය වන බැවින් මිල ගණන් වල ඉහළ යාමක් අපේක්ෂා කෙරේ.

**වගුව 3.2 : එළවළු සිල්ලර මිල - 2021 අප්‍රේල්**

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2021 අප්‍රේ. | **2021 අප්‍රේ.** | **2021 මාර්තු** | **2020 අප්‍රේ.** | **2021 මාර්තු** | | **2020 අප්‍රේ.** | |
| | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | % | කි.ග්‍රෑ.රු. | % |
| බෝංචි | 90.00-280.00 | 191.33 | 222.48 | - | *-31.16* | *-14.00* | - | - |
| කැරට් | 150.00-280.00 | 207.35 | 211.19 | - | *-3.84* | *-1.82* | - | - |
| ලීක්ස් | 80.00-200.00 | 142.03 | 151.43 | - | *-9.40* | *-6.20* | - | - |
| බීට්රූට් | 80.00-200.00 | 143.46 | 164.75 | - | *-21.29* | *-12.93* | - | - |
| නෝකෝල් | 100.00-200.00 | 149.77 | 173.84 | - | *-24.08* | *-13.85* | - | - |
| රාබු | 60.00-160.00 | 121.45 | 128.26 | - | *-6.81* | *-5.31* | - | - |
| ගෝවා | 80.00-200.00 | 163.81 | 171.21 | - | *-7.40* | *-4.32* | - | - |
| තක්කාලි | 80.00-200.00 | 144.06 | 202.04 | - | *-57.98* | *-28.70* | - | - |
| බණ්ඩක්කා | 80.00-200.00 | 144.85 | 152.67 | - | *-7.82* | *-5.12* | - | - |
| වම්බටු | 150.00-280.00 | 209.63 | 142.97 | - | *66.66* | *46.63* | - | - |
| මාළු මිරිස් | 180.00-480.00 | 309.63 | 332.05 | - | *-22.41* | *-6.75* | - | - |
| වට්ටක්කා | 70.00-160.00 | 120.67 | 150.63 | - | *-29.96* | *-19.89* | - | - |
| පිපිඤ්ඤා | 50.00-160.00 | 104.30 | 98.06 | - | *6.24* | *6.36* | - | - |
| කරවිල | 120.00-320.00 | 218.99 | 237.45 | - | *-18.46* | *-7.78* | - | - |
| පතෝල | 100.00-200.00 | 149.95 | 162.86 | - | *-12.91* | *-7.93* | - | - |
| මුරුංගා | 240.00-600.00 | 480.98 | - | - | - | - | - | - |
| වැටකොළු | 100.00-240.00 | 170.60 | 213.41 | - | *-42.81* | *-20.06* | - | - |
| මෑ කරල් | 60.00-200.00 | 137.76 | 151.86 | - | *-14.10* | *-9.28* | - | - |
| අළු කෙසෙල් | 60.00-160.00 | 123.25 | 130.03 | - | *-6.78* | *-5.21* | - | - |
| අමු මිරිස් | 180.00-500.00 | 328.61 | 364.61 | - | *-36.00* | *-9.87* | - | - |
| දෙහි | 100.00-400.00 | 222.38 | 216.59 | - | *5.79* | *2.67* | - | - |

***මූලාශ්‍රය: අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය***

## 4. පලතුරු

### ඉල්ලුම / සැපයුම සහ මිලෙහි හැසිරීම

2021 වසරේ මාර්තු මාසයෙහි මිල ගණන් හා සැසඳීමේදී කර්තකොලොම්බන් සහ විලාඩ් අඹ ද අලිගැටපේර සහ ආනයනික මිදි ද හැර අනෙකුත් සියලුම පලතුරු වර්ගයන්හි තොග මිල ගණන් අප්‍රේල් මාසයේදී ඉහළ ගොස් ඇත. ඒ අනුව ඇඹුල් සහ කෝලිකුට්ටු කෙසෙල් මිල ගණන් පිළිවෙළින් 38%කින් සහ 28%කින් ඉහළ ගොස් ඇති අතර ඇඹුල් කෙසෙල් කිලෝවක් රු.60.00-100.00 අතර මිලකට ද කෝලිකුට්ටු කෙසෙල් කිලෝවක් රු.160.00-240.00 අතර මිලකට ද අලෙවි වී ඇත. සීනි කෙසෙල් මිල 8%කින් ඉහළයාමක් පෙන්නුම් කරන අතර කිලෝවක මිල රු.60.00-100.00 අතර විය. තවද, 1%ක මිල ඉහළයාමක් ආනමාලු හා ඇම්බුන් කෙසෙල් සඳහා සටහන් වී තිබූ අතර ගෙඩියක මිල පිළිවෙළින් රු.12.00-16.00ක් සහ රු.15.00-20.00ක් ලෙස දැකගත හැකි විය. කුඩා, මධ්‍යම සහ විශාල ප්‍රමාණයෙහි අන්නාසි මිල ගණන් ද පිළිවෙළින් 11%කින්, 8%කින් සහ 5%කින් ඉහළ ගොස් තිබුණු අතර ඒවායෙහි මාසික සාමාන්‍ය තොග මිල සටහන් වී තිබුණේ පිළිවෙළින් ගෙඩියක් රු.117.38ක්, රු.158.00ක් සහ රු.192.33ක් ලෙසයි. එසේම අන්නාසි මිල පරාසය ගෙඩියකට රු.100.00-210.00ක් ලෙස විය. බෙට්ටි අඹ මිල 17%කින් ඉහළ යාමක් පෙන්නුම් කළ අතර, ගෙඩියක මිල රු.28.00-45.00 පරාසයක විය. තවද, පැපොල් සඳහා 4%ක මිල ඉහළයාමක් දැකගත හැකි වූ අතර මාසික සාමාන්‍ය තොග මිල කිලෝවක් රු.99.22ක් ලෙස ද මිල පරාසය කිලෝවකට රු.60.00-150.00ක් ද විය. ඊට අමතරව බෙලි, දිවුල්, වැල්දොඩම් සහ පැණි දොඩම් මිල ද පිළිවෙළින් 36%කින්, 22%, 10%කින් සහ 3%කින් ඉහළ ගොස් ඇත (වගුව 4.1).

කෙසේ වුවද ඉහත සඳහන් කළ පරිදි විලාඩ් සහ කර්තකොලොම්බන් අඹ මිල පිළිවෙළින් 56%කින් සහ 21%කින් පහත වැටී තිබුණු අතර ගෙඩියක මිල සටහන් වී තිබුණේ පිළිවෙළින් රු.14.00-17.00ක් සහ රු.30.00-180.00ක් ලෙසයි. ඊට අමතරව අලිගැටපේර සහ ආනයනික මිදි මිල ද පිළිවෙළින් 30%කින් සහ 3%කින් පහළ ගොස් තිබුණු අතර අලිගැටපේර ගෙඩියක මිල රු.30.00-75.00 පරාසයක ද මිදි මිල කිලෝවක් රු.720.00-889.00 පරාසයක ද අලෙවි වී ඇත (වගුව 4.1).

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වසරේ අප්‍රේල් මාසයේදී මිල ගණන් සටහන් කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් පෙර කළාපවල සිදු කළ පරිදි පසුගිය වසරේ අප්‍රේල් මාසයෙහි මිල ගණන් සමග මෙම අප්‍රේල් මාසයේ මිල ගණන් සංසන්දනය කිරීමට මෙම කාලපය තුළ දී නොහැකි වී ඇත.

**වගුව 4.1 පලතුරු තොග මිල -2021 අප්‍රේල්**

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2021 අප්‍රේ. | 2021 අප්‍රේ. | 2021 මාර්තු | 2020 අප්‍රේ. | 2021 මාර්තු | | 2020 අප්‍රේ. | |
| | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | % | (රු.) | % |
| ***කෙසෙල්*** | | | | | | | | |
| ඇඹුල් (කි.ග්‍රෑ.) | 60.00-100.00 | 74.72 | 54.17 | - | *20.55* | *37.94* | - | - |
| කෝලිකුට්ටු (කි.ග්‍රෑ.) | 160.00-240.00 | 194.11 | 151.00 | - | *43.11* | *28.55* | - | - |
| සීනි කෙසෙල්(කි.ග්‍රෑ.) | 60.00-100.00 | 78.28 | 72.59 | - | *5.69* | *7.83* | - | - |
| ආනමාළු (ගෙඩියක මිල) | 12.00-16.00 | 13.42 | 13.30 | - | *0.12* | *0.91* | - | - |
| ඇම්බුන් (ගෙඩියක මිල) | 15.00-20.00 | 16.84 | 16.73 | - | *0.11* | *0.67* | - | - |
| ***අඹ*** | | | | | | | | |
| බෙට්ටි අඹ (ගෙඩියක මිල) | 28.00-45.00 | 36.58 | 31.18 | - | *5.40* | *17.33* | - | - |
| කර්තකොලොම්බන් (ගෙඩියක මිල) | 30.00-180.00 | 102.45 | 129.35 | - | *-26.90* | *-20.79* | - | - |
| විලාඩ් (ගෙඩියක මිල) | 14.00-17.00 | 15.14 | *34.47* | - | *-19.32* | *-56.07* | - | - |
| කොහු (ගෙඩියක මිල) | - | - | 20.17 | - | - | - | - | - |
| අන්නාසි(ලොකු-ගෙඩියක මිල) | 170.00-210.00 | 192.33 | 182.65 | - | *9.67* | *5.29* | - | - |
| අන්නාසි(මධ්‍යම-ගෙඩියක මිල) | 140.00-170.00 | 158.00 | 145.63 | - | *12.37* | *8.49* | - | - |
| අන්නාසි (කුඩා-ගෙඩියක මිල) | 100.00-130.00 | 117.38 | 105.82 | - | *11.56* | *10.92* | - | - |
| පැපොල් (කි.ග්‍රෑ.) | 60.00-150.00 | 99.22 | 95.38 | - | *3.84* | *4.02* | - | - |
| වැල්දොඩම් (ගෙඩියක මිල) | 11.00-21.00 | 14.28 | 12.94 | - | *1.35* | *10.42* | - | - |
| දිවුල් (ගෙඩියක මිල) | 37.00-65.00 | 48.51 | 39.64 | - | *8.87* | *22.38* | - | - |
| දොඩම් (ගෙඩියක මිල) | 25.00-40.00 | 30.83 | 29.96 | - | *0.87* | *2.91* | - | - |
| අලිගැටපේර (ගෙඩියක මිල) | 30.00-75.00 | 50.36 | 71.88 | - | *-21.51* | *-29.93* | - | - |
